මාතෘකාවේ අග කොටස කිව යුතු නැත. මා පෑන අතට ගත්තේ ලෝකයේ මහ බලවතුන් ගේ කෙළි සෙල්ලම් ගැන ලිවීමටය. එහෙත් අප උපන් දහම් දිවයිනේ අද සිදුවන කෙළි සෙල්ලම් - විකට ජවනිකා - ගසා කෑම් සහ ගිනි කෙළි දකින විට - අසන විට - ඒ ගැන යමක් නොලියා සිටීම පහසු නොවේ.

රතුපස්වල වෙඩි තැබීම - අරනායක .. සාලවේ ගින්න සහ සයිටම් නාඩගමත් බයිසිකල් පැදීම වැනි සිල්ලර කෙළිවලට ඒ කිසිවෙක් සහභාගි නොවූ හ. බනිස් කෑමේ තරගයට සහභාගි නොවූ රජගෙදර රජ බොජුන් වළඳන අයට බනිස් දිරවා ගත නොහැකි බව කිව යුතුය. කඹ ඇදීමේ තරගය දිනුවේ ලේක්හවුස් ආයතනයෙන් දීපු රුපියල් 50000 චෙක්පත අරන් ගිහින් සුනිල් මාධව ප්‍රේමතිලකට පිරිනැමූ ඇමතියනගේ කණ්ඩායමකි.

# රෝමය ගිණි ගනිද්දී........



තවමත් කෙළවරක් විසඳුමක් නොලැබූ ජාතික ගැටලු බවට පත්ව තිබියදී අද උදේ (2017.04.16) අසන්නට ලැබුණේ ඒ සියල්ලටම වඩා දරුණු විනාශයකි. මීතොටමුල්ලේ කාලයක් තිස්සේ ගොඩගැහෙමින් පැවති කොළඹ නගරය සතු කුණු කන්දරාව නාය යාම නොහොත් කඩාවැටීම හේතුකොටගෙන සිදු වූ මහා ව්‍යසනය යි. ගෙවල් ගණනක් යටකරගෙන පරාණ 19 ක් හෝ ඊට වැඩි ගණනක් බිලි ගනිමින් ඒ මහා විනාශය සිදුවන තෙක්ම බලධාරීහු බලා සිටියෝ ය. පොල් ගහට නැගපු හොරා වගේ දැන් මේ නඩුවට දීමට උත්තරත් සොයාගෙනය. ඉවත්වීමට නියම කරන ලද ගෙවල් හිමියෝ එයට එකග නොවීමේ වරදයි. එහෙම කියන අයට එල්ල කළ යුතු ගිනි අවියට දැමිය යුතු මූනිස්සම් ගැන අප පුංචි කාලේ වහරපු වචනය මට මතක ය. සීනි නොව ලුණු ය එසේ දැමීමට පුංචි අප යෝජනා කළේ. පව් පිරෙනවා යයි හාමුදුරුවන් කීමට ඉඩ ඇති නිසා මම එය නොකියමි.

මව් බිමට නොගියත් මෙහේ ඉදන්ම එහි සිරි නැරඹීමට තරම් අපි පින් කොට ඇත්තෙමු. අද මට දක්නට ලැබුණේ රූපවාහිනියේ අවුරුදු උළෙලකි. පොහොසත් හෝටලයේ පවත්වන ලද්දක්. නළු නිළියන් සමග මැති ඇමතිවරුන් සහභාගිකරවාගෙන කරන සැණකෙළියක්. අලියාට ඇහැ තැබීම. කඹ ඇදීම. සින්දු කීම. වාගේ කෙළිසෙල්ලම් ගැහැනු පිරිමි දෙගොල්ලොම සහභාගි වූ බව දැක ගත හැකිවිය. එහෙත් ලිස්සන ගහේ නැගීම - කොට්ට පොරය - හෙම්හිට ගැහුනු පිරිමි දෙපැත්තටම රූපවාහිනී සළකුණ සහති කමිස දී තිබුණි. ඒ පිරිස පිනවීම් වස් ඉදිරිපත් කරන ලද වාදක මණ්ඩලයට - බොලිවුඩ් - කළගෙඩි - ලී කෙළි ආදී නැටුම් නැටීමටආ දැරියන්ට - නිවේදක නිවේදිකාවන්ට - කැමරා ශිල්පීන්ට - යන මෙකී නොකී සියලූ දෙනාටම කොපමණ නම් මුදලක් රූපවාහිනියෙන් වැය කරන්නට ඇද්ද? සම්පත් බැංකුව - ලොතරැයි මණ්ටලය වැනි ආයතන ද එහි බරපැන දැරීමට හවුල් වූ බව පෙනෙයි. ආචාර්ය පබිලිස් සිල්වා නොහිටියාට අගේ ඇති ආහාර වේලක් පිළියෙළ කොට තිබුණු බවද පෙනුණි. මැති ඇමතිවරුන් පිනවීමට මෙසේ වැය කරන ආයතන හෝ පුද්ගලයෝ යට කී ව්‍යසනවලින් පීඩාවට පත් දහස් ගණන් ජනයා වෙනුවෙන් සතයක්වත් වියදම් කළේද යන ප්‍රශ්නය ඇසිය යුතුය. එබදු දෙයක් මැති ඇමතිවරුන්ගේ ඇගට ද නොදැනෙන්නේ ඔවුන්ට එහි සම්ප්‍රාප්තවීම සදහා මහජන මුදලින් ලබා දුන් වාහන සහ ආරක්ෂක භට පිරිස්ද හිටිය නිසා ය. ඒ සමහරුන් අද හෙට සිය නිල රියේම මීතොටමුල්ලට ගිහින් සංවේගය ප්‍රකාශකරනු ඇත.

දැන් මගේ නියම මාතෘකාවට. එය තරමක් දිග ය.

**මොහොමඩ් මොසාඩක් - ෂා පලාවි - පර්සියානු අධිරාජයා - අයතුල්ලා කුමේනි - සදාම්**




**හුසේන් - ජෝර්ජ් බුෂ් - බරක් ඔබාමා සහ ඩෝනල්ඩ් ට්‍රම්ප්**

වත්මන් සංස්කෘති ඝට්ටනය නමින් හැඳින්වියයුතු ඉස්ලාම් අන්තවාදීන්ට එරෙහිව ඇමරිකාව ඇතුළු බටහිර රටවල් (අප වසන රටත් එහෙම වෙලාවට බටහිරට අයත් වන්නකි) දියත් කොට ඇති සංග්‍රාමය ගැන කියන - විවේචනය කරන - කිසි කෙනෙක් ඒ සටන පටන් ගත් ආකාරය නොහොත් එයට මුල් වූ සිදුවීම ගැන කතා නොකරති. එය සාමාන්‍යයෙන් කාටත් පුරුදු ධර්මතාවකැයි ද කිව හැකි ය. රෝග නිදානය සොයා ගෙන ප්‍රතිකාර කිරීම සියලූ වෙදුන්ට පුරුදු ක්‍රමයද නොවේ. රෝග ලක්ෂණ තුරන් කිරීම අරමුණු කොට ගත් ප්‍රතිකාර විධියකි - කාටත් පුරුදුව ඇත්තේ. ජාත්‍යන්තර ගැටලූ හා අරගල වලටත් ඒ ක්‍රමයම අනුගමනය කිරීම නිසා අද වන විට බොහෝ රෝග උත්සන්න වී තුවාල ඔද්දල් වී ඇති බව කිසිවකුට නොපෙනේ. දුටුවත් නොදුටුවාක් මෙන් පරණ පොතම දිගඇර ගනිති.

න්‍යෂ්ඨික අවි ගැන ඉරානයට ඇගිලි දිගු කරන කිසිවෙක් ඉරානයට - එදා පැවති පර්සියාවට අපරදිගුවන් කළ හානිය අසාධාරණය ගැන කිසිවක් නොකියති.

එය පටන් ගත්තේ 1951 අප්‍රියෙල් මස ඉරානයේ තෙල් ආකර ජනසතු කිරීමේ යෝ ජනාව එරට මන්ත්‍රී මන්ඩලයට ඉදිරිපත් කළ දිනයේ ය. එතෙක් ඉරානයේ තෙල් ආකර සතුව තිබුනේ බ්‍රි.ානයයටය. මේ වෙනස නිසා ඇති වූ හිදැස පිරවීමට කර පෙවූ ඇමරිකාව අදත් ඒ පුරුද්දම අනුගමනය කරයි. මොසාඩක් පහ කොට ෂා අධිරාජයාගේ බලය තහවුරු කළ ඇමරිකාවට පරණ කරපු පව් දැන් අමතක වෙලා ය. ඒ මදිවට දැන් තවත් රටක් ඉරානයට තර්ජනය කිරීමට පටන්ගෙන ඇත. ඒ එක්සත් ජනපදයේ පූර්ණ අනුග්‍රහය ලබමින් අවි බලයෙන් ශක්තිමත් වූ ඉස්රායලයයි.

සියවස් ගණනක් තමන්ගේ නිජ බිම වූ - තමන් වගා කළ ගොවි බිම වූ පලස්තීනයෙන් එරටවාසීන් පිට මං කොට ඔවුන් සිය

**ඇමරිකාව කළ තුන්වැනි පාප කර්මය කිරීමට ඉදිරිපත්වූයේ සංග්‍රාම ජනාධිපති යනුවෙන් තමාටම කියා ගත් ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරියේ අතේ පැලවෙන බොරුවක් කීමට කොලින් පාවල් එවමින් පටන්ගත් ලෝක බොරුව කිරීමට එ ජා සංවිදානයේ අනුමැතිය නොලැබුණ ද සිය මනාපයට ස්වෛරී රාජ්‍යයක් වූ ඉරාකය ආක්‍රමණය කිරීම බුෂ්ට ප්‍රශ්නයක් නොවී ය.**

නිජභ_මිය තුළම සරණාගතයන් බවට පත් කළ ඉස්රායලයට උඩ ගෙඩි දීම ඇමරිකාව මේ ගැටලූව දිග් ගැස්සීමට කරපු දෙවැනි වරදය. ඒ වරද තවත් බරපතළ වනුයේ තමන් සතු න්‍යෂ්ටික අවි ගබඩාව ගැන

14 වන පිටට

House for sale in Kelaniya





41 ½ Perches Land, 2 Large Store Rooms with a bare-land
2 Storied Spacious House with 4 Bedrooms and 2 Bathrooms
1 Large outdoor Kitchen in addition to the Kitchen inside
Separate Servant Rest Room and Bath Room
2 Large Store Rooms with a bare-land
House is surrounded by 2 prominent schools in Gampaha
The property is located in just 3.5 Kms from Colombo City
**Contact Details-** 0433298305 or +94 774137711